## වැටුප්

රජයේ සේවකයින්ගේ මූල්‍ය වැටුප් 1978 ට වඩා වේගයෙන් 1979 දී ඉහළ නැග ඇති බව පවත්නා දත්ත අනුව පෙන්නුම් කෙරේ. පසුගිය වර්ෂයේ සියයට 12 කින් වැඩි වූ කාර්මික හා ලිපිකරු සේවකයින්ගේ මූල්‍ය වැටුප් 1979 දී සියයට 16 කින් වැඩි විය. සුළු සේවකයින් හා රජයේ ගුරුවරුන් ගැන සලකා බලන විට මූල්‍ය වැටුප්වල වැඩිවීම 1978 දී පිළිවෙලින් සියයට 16 ක් හා සියයට 10 ක්වූ අතර, මෙම වර්ෂයේ එය සියයට 21 ක් හා සියයට 15 ක් විය. මෙම වැඩිවීමට හේතුවූයේ ජනවාරි මාසයේ මාසික ඒකාබද්ධ වැටුප සියයට 10 කින් වැඩිකිරීම හා සැප්තැම්බර් මාසයේදී තවත් රුපියල් 55 ක අතිරේක මාසික දීමනාවක් පිරිනැමීමයි.

කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකය යොද මණිනු ලබන රජයේ සේවකයින්ගේ මූර්ත වැටුප් වැඩි වූයේ මූල්‍ය වැටුප් වර්ධන අනුපාතයට වඩා අඩු අනුපාතයකිනි. කෙසේ නමුත් මෙය මූර්ත වැටුපේ අඩුවීමක් පෙන්නුම් කළ 1978 වර්ෂයට වඩා හොඳ දියුණුවක් පෙන්නුම් කරන්නකි කාර්මික හා ලිපිකරු සේවකයින්ගේ මූර්ත වැටුප සියයට 5 කින් වැඩි වූ අතර, පසුගිය වර්ෂයේ එය ස්ථායීව පැවතුණි. 1978 දී සියයට 1 කින් අඩුවූ රජයේ ගුරුවරුන්ගේ මූර්ත වැටුප 1979 දී සියයට 4 කින් වැඩි විය. මේ අතර, සුළු සේවකයින්ගේ මූර්ත වැටුප පසුගිය අවුරුද්දේ සියයට 4 ක වැඩිවීම හා සසඳන විට, 1979 වර්ෂයේ සියයට 9 කින් වැඩිවිය.

1979 දී වෙතන මණ්ඩල රෙගුලාසිවලට යටත්වන පෞද්ගලික අංශයේ සේවකයින්ගේ මූල්‍ය වැටුප් සියයට 27 කින් වැඩි විය. කෘෂිකාර්මික අංශයේ සේවකයින්ගේ මූල්‍ය වැටුප් සියයට 28 කින් වැඩිවූ අතර, කර්මාන්ත හා වාණිජ අංශයේ සේවකයින්ගේ වැටුප් සියයට 17 කින් වැඩිවිය. මූල්‍ය වැටුප්වල වර්ධනය කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකය යොද වට්ටම් කළ විට, කෘෂිකාර්මික අංශයේ සේවකයින්ගේ මූර්ත වැටුප් සියයට 15 කින් ද, කර්මාන්ත හා වාණිජ අංශයේ සේවකයින්ගේ මූර්ත වැටුප් සියයට 5 කින් ද වැඩි විය.

කෙසේවුවද, රජයේ සේවකයින් සඳහා වන මහ බැංකු වැටුප් අනුපාත දර්ශක පදනම් වී ඇත්තේ රජයේ සේවකයින්ට ඒ ඒ පරිමාණ අනුව ගෙවිය යුතු වැටුප් හා වේතන මත බව සැළකිය යුතුය. වැටුප් මණ්ඩල වලට යටත්වන පෞද්ගලික අංශයේ කෘෂිකර්ම, කර්මාන්ත හා වාණිජ අංශ සඳහා වූ කම්කරු දෙපාර්තමේන්තුවේ වැටුප් දර්ශක වලට ඇතුළත්ව ඇත්තේ එම වැටුප් මණ්ඩල මගින් අනුමත අවම වැටුප් සහ 1967 දෙසැම්බර් සිට ගෙවනු ලබන "අවප්‍රමාණ දීමනාව" පමණි. මේ අනුව වැටුප් දර්ශකවලට අතිකාල දීමනා හා දිරිගැන්වීමේ දීමනා ඇතුළත් නොවේ. මේවා ඇතුළත් නොවුවද, 1979 සාමාන්‍ය මිළ වැඩිවීම කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකයෙන් පෙන්නුම් කරනවාට වඩා ඉතා අධික වූ අතර, කෘෂිකාර්මික අංශය හැර අනික් අංශවල මූර්ත වැටුප අඩු වූ බව පෙන්නුම් කරයි.

## සේවා නියුක්තිය

ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ වෙනස්වීම පරීක්ෂා කිරීමට ඇති ප්‍රධාන සීමාවක් නම විධිමත් හා අඛණ්ඩ සංඛ්‍යාලේඛන හිඟවීමයි. එබැවින් මෙම විශ්ලේෂණයේදී මුළු ශ්‍රම සමූහය, සේවා නියුක්ති සංඛ්‍යාව හා සේවා වියුක්ති සංඛ්‍යාව වැනි වැදගත් විචල්‍යයන් හුදෙක් අක්‍රමවත් කාලඅන්තරයන්හි කරන ලද නියැදි සමීක්ෂණ සහ ජනලේඛන මගින් ලබාගත් දත්ත මත තක්සේරුකර ඇත.

1971 ජනලේඛනයට අනුව ශ්‍රම සමූහය දශලක්ෂ 4·5 ක්වූ අතර, එය මුළු ජනසංඛ්‍යාවෙන් සියයට 35 ක් විය. මහබැංකුව මගින් පවත්වන ලද 1973 පාරිභෝගික මූල්‍ය සමීක්ෂණයට අනුව ශ්‍රම සමූහය පිළිබඳ තක්සේරුව මීට වඩා තරමක් අධිකය. 1978 මහබැංකු පාරිභෝගික,

මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණයේ ප්‍රථම වටයෙන් ලබාගත් මූලික දත්ත අනුව ශ්‍රම සමූහය දශලක්ෂ 5.7 ක් බව පෙන්නුම් කරන අතර, එය 1979 මුළු ජන සංඛ්‍යාවෙන් සියයට 39 කි.

ජනලේඛන දත්ත අනුව 1971 සේවා වියුක්ති සංඛ්‍යාව 8,39,246 ක්වූ අතර, 1973 පාරිභෝගික මූල්‍ය සමීක්ෂණයේ තක්සේරු කිරීම අනුව එය දශලක්ෂයක් විය. 1978 පාරිභෝගික, මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණයේ මුල් අදියරෙහි මූලික දත්ත අනුව, සේවා වියුක්ති සංඛ්‍යාව 8,74,000 ක්වූ අතර, එය රටේ සේවා වියුක්තිය සියයට 13 කින් අඩුවීමක් පෙන්නුම් කරන්නකි. මේ අළුත්ම දත්ත හා 1973 පාරිභෝගික මූල්‍ය සමීක්ෂණයේ ප්‍රතිඵල සංසන්දනය කිරීමක් පහත දැක්වේ.

1·13 වැනි සංඛ්‍යා සටහන

ශ්‍රම සමූහයේ ප්‍රතිශතයක් ලෙස සේවා වියුක්තිය

| අංශය | 1973 | 1978 |
|---|---|---|
| නාගරික .. .. .. | 32·1 | 21·2 |
| ග්‍රාමීය .. .. .. | 24·5 | 15·4 |
| වතු .. .. .. | 12·0 | 5·4 |
| සියළුම අංශ .. .. .. | 24·0 | 15·3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ඉහත සංඛ්‍යා නිරීක්ෂණය කිරීමේදී ප්‍රධාන සීමාවක් ඇති බව සිහි තබා ගත යුතුය. එනම් මෙම සමීක්ෂණ දෙක එකිනෙකට වෙනස් කාලපරිච්ඡේද දෙකක් තුළ පැවැත්වූ බවයි. 1978–79 සමීක්ෂණයේ මුල් අදියර 1978 වර්ෂයේ අවසාන තෙමස තුළ පැවැත්වූ නමුදු, 1973 සමීක්ෂණය වර්ෂයේ මුල් දෙමස තුළ පවත්වන ලදී. මෙම කරුණට යටත්ව සළකනවිට රටේ සේවා වියුක්තිය 1973 දී සියයට 24 සිට 1978 දී සියයට 15 දක්වා පහත බැස ඇති බව පෙන්නුම් කෙරේ. 1973 දීද ඉතාම පහත් මට්ටමක පැවැති වතු අංශයේ සේවා වියුක්තියෙහි විශාලතම පහත බැසීමක් පෙන්නුම් කරන අතර, එය 1978 මුළු ශ්‍රම සමූහයෙන් සියයට 5·4 ක් විය. ග්‍රාමීය අංශයේ සේවා වියුක්තිය නාගරික අංශයට වඩා අඛණ්ඩව අඩුවූ අතර, එය 1973 දී සියයට 24 සිට 1978 දී සියයට 15 දක්වා පහත බැස ඇත. සේවා වියුක්තිය ඉතාම උග්‍රවූයේ නාගරික අංශයේය. මෙසේවුවද, එය සියයට 32 සිට සියයට 21 දක්වා අඩුවීමක් පෙන්විය.

සේවා වියුක්තිය දිස්ත්‍රික්ක අනුව නිරීක්ෂණය කිරීමේදී ප්‍රාදේශීය රටාවක් පෙන්නුම් කරයි. වැඩිම සේවා වියුක්ති අනුපාතය නිරිත දිග මුහුදුබඩ තීරයේ විය. කොළඹ, කළුතර, ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල සේවා වියුක්ති අනුපාතය සියයට 14 සිට සියයට 21 දක්වා වෙනස් වේ. අධික සේවා වියුක්ති අනුපාතයක් ඇති අනෙක් ප්‍රදේශ නම් නුවර, මාතලේ, රත්නපුරය හා කෑගල්ල දිස්ත්‍රික්ක වලින් සමන්විත වන මැදිරට කලාපයයි. ප්‍රධාන උස්බිම් තේ කලාපය වන නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්කවල සාපේක්ෂ වශයෙන් අඩු සේවා වියුක්ති අනුපාතයක් විය. වියළි කලාපීය ප්‍රදේශවල (අනුරාධපුරය, මොනරාගල, වවුනියාව,) අවම සේවා වියුක්ති අනුපාතයක් පෙන්නුම් කළේය.

**1·14 වැනි සංඛ්‍යා සටහන**

**දිස්ත්‍රික්ක අනුව සේවා වියුක්තිය 1978**

| දිස්ත්‍රික්කය | | ශ්‍රම සමූහයේ ප්‍රතිශතයක් ලෙස සේවා වියුක්තිය | දිස්ත්‍රික්කය | | ශ්‍රම සමූහයේ ප්‍රතිශතයක් ලෙස සේවා වියුක්තිය |
|---|---|---|---|---|---|
| කොළඹ | .. | 20·2 | මන්නාරම | .. | *ල.නො. |
| කළුතර | .. | 17·0 | වවුනියාව | .. | 4·3 |
| ගාල්ල | .. | 21·2 | ත්‍රිකුණාමලය | .. | 11·9 |
| මාතර | .. | 20·1 | මඩකලපුව | .. | *ල.නො. |
| හම්බන්තොට | .. | 18·8 | නුවර | .. | 15·0 |
| මොණරාගල | .. | 4·8 | මාතලේ | .. | 12·9 |
| අම්පාර | .. | *ල. නො. | නුවරඑළිය | .. | 9·3 |
| පොළොන්නරුව | .. | *ල. නො. | බදුල්ල | .. | 9·4 |
| අනුරාධපුරය | .. | 3·9 | රත්නපුරය | .. | 11·0 |
| පුත්තලම | .. | 9·5 | කෑගල්ල | .. | 21·7 |
| යාපනය | .. | 10·8 | කුරුණෑගල | .. | 13·6 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* 1978 කුණාටුව හේතුකොට දත්ත රැස්කල නොහැකි විය.

අධ්‍යාපනික මට්ටම් අනුව වර්ග කරන විට ද්විතීය අධ්‍යාපනයක් ලැබූ අය අතර සේවා වියුක්තිය ඉතාම උග්‍ර බැව් හෙළිවිය. (ද්විතීය අධ්‍යාපනය-අ.පො.ස.සාමාන්‍ය පෙළ සමත් සහ අ.පො.ස.උසස් පෙළ සමත්) උසස් අධ්‍යාපනයක් ලැබූ (උපාධිය සමත්) අය අතර සේවා වියුක්තිය ඉතාම අවම මට්ටමක පැවතුනි. පසුගිය අවුරුදු පහ තුළ සේවා වියුක්තියේ විශාලතම අඩුවීම (සියයට 80) පෙන්නුම් වන්නේ මෙම කාණ්ඩය තුළය.

**1·15 වැනි සංඛ්‍යා සටහන**

**අධ්‍යාපනික කාණ්ඩ අනුව සේවා වියුක්තිය**

| අධ්‍යාපනික කාණ්ඩය | | | ශ්‍රම සමූහයේ ප්‍රතිශතයක් ලෙස සේවා වියුක්තිය | |
|---|---|---|---|---|
| | | | 1973 | 1978 |
| පාසැල් නොගිය | .. | .. | 7·9 | 4·0 |
| ප්‍රාථමික | .. | .. | 14·1 | 7·2 |
| ද්විතීය | .. | .. | 37·1 | 21·9 |
| අ. පො. ස. (සා. පෙ.) සමත් | | .. | 47·4 | 29·2 |
| අ. පො. ස. (උ. පෙ.) සමත් | | .. | 44·4 | 31·7 |
| උපාධිය සමත් | .. | .. | 16·2 | 3·2 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සේවා වියුක්තිය පිරිමින්ට වඩා ගැහැණුන් අතර උග්‍ර බව සමීක්ෂණ දත්ත වලින් දැක්වෙන අතර එම තත්ත්වය 1973 ට වඩා 1978 දී තවත් වැඩිවී ඇත. පිරිමින් අතර සේවා වියුක්තිය 1973 දී සියයට 18·9 සිට 1978 දී සියයට 9.6 දක්වා අඩුවිය. නමුත් ගැහැණුන් අතර එම අනුපාතය අඩුවූයේ සියයට 36·4 සිට සියයට 25.6 දක්වා පමණි. වයස් කාණ්ඩ අනුව වර්ගීකරණයෙන් සේවා වියුක්තිය ඉතාම අධික අවුරුදු 19-25 අතර වයස් කාණ්ඩය තුළ (සියයට 25) බව හෙළිවන අතර, අවුරුදු 46-55 අතර වයස් කාණ්ඩය තුළ එය (සියයට 0·8) අවම විය. අවුරුදු 14-25 අතර වයස් කාණ්ඩය තුළ සේවා වියුක්තියේ පැහැදිලි අඩුවීමක් පෙන්නුම් කෙරේ.

### 1·16 වැනි සංඛ්‍යා සටහන

### වයස් කාණ්ඩ අනුව සේවා වියුක්තිය

| වයස් කාණ්ඩය (අවුරුදු) | ශ්‍රම සමූහයේ ප්‍රතිශතයක් ලෙස සේවා වියුක්තිය | |
|---|---|---|
| | 1973 | 1978 |
| 14 — 18 .. .. | 65·8 | 23·6 |
| 19 — 25 .. .. | 41·5 | 24·9 |
| 26 — 35 .. .. | 15·2 | 11·5 |
| 36 — 45 .. .. | 3·9 | 4·1 |
| 46 — 55 .. .. | 1·2 | 0·8 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ මහ බැංකු වාර්ෂික සමීක්ෂණයට අනුව රාජ්‍ය දෙපාර්තමේන්තුවල සේවා නියුක්ති සංඛ්‍යාව 1979 දී 33,713 කින් නැතහොත් සියයට 5 කින් වැඩිවිය. මෙම වර්ධනයෙන් සියයට 39 ක් සහායක ශ්‍රේණි වලද, සියයට ·29 ක් ගුරු වෘත්තියේ ද, සියයට 24 ක් සුළු සේවක අංශවලද ඇතිවිය. අර්ධ රාජ්‍ය ආයතන (රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල) වල සේවා නියුක්ති සංඛ්‍යාව 89,385 කින් නැතහොත් සියයට 14 කින් වර්ධනය විය. මින් සියයට 83 ක් සුළු සේවා අංශවල වූ අතර, සියයට 14 ක් සහායක ශ්‍රේණිවල විය. රාජ්‍ය වැවිලි අංශයේ සේවා නියුක්තිය 61,000 කින් නැතහොත් සියයට 13 කින් වර්ධනය විය. මේ අනුව අර්ධ රාජ්‍ය අංශයේ ඇතිවූ රැකියා වර්ධනයෙන් 2/3 කට වඩා රාජ්‍ය වැවිලි අංශය වග කීවේය.

ආයතනික පෞද්ගලික අංශයේ සේවා නියුක්තියේ වෙනස්කම් මැනීමට මිනුමක් වශයෙන් ප්‍රයෝජනයට ගනු ලබන සේවක අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරී ගිණුම් සංඛ්‍යාව අනුව 1979 දී මෙම සංඛ්‍යාව 1,02,479 කින් හෙවත් සියයට 10 කින් වැඩිවී ඇත. අරමුදලට සාමාජික මුදල් එවනු ලබන අර්ධ රාජ්‍ය ආයතන වල ඇතිවූ නව රැකියා සංඛ්‍යාව අඩුකළ විට, පෞද්ගලික අංශයේ ශුද්ධ රැකියා වර්ධනය 1979 දී 22,525 ක් වූ බව තක්සේරු කළ හැකිය.

ඉහත දක්වන ලද සංඛ්‍යාලේඛන අනුව, 1979 දී රාජ්‍ය දෙපාර්තමේන්තු, අර්ධ රාජ්‍ය ආයතන හා ආයතනික පෞද්ගලික අංශයේ රැකියා වර්ධනය 1,36,000 ක් පමණ වූ බව පෙනේ. එය 1978 දී 1,45,000 ක් විය. කෙසේ වුවද මෙම සංඛ්‍යා වලට සංවිධානය නොවූ පෞද්ගලික අංශයේ සහ දේශීය කෘෂිකාර්මික අංශයේ ඇතිවූ රැකිරක්ෂා ඇතුළත් නොවේ.

1979 වර්ෂය තුළ මැද පෙරදිග රැකියා සඳහා ගිය ලාංකිකයින්ගේ සංඛ්‍යාව වැඩිවිය. මෙම පුහුණු ශ්‍රම සංක්‍රමණය නිසා රට තුළ පුහුණු ශ්‍රම හිඟයක් ඇතිවන බැවින් පාසැල් මට්ටමින් ශ්‍රමිකයන් පුහුණු කිරීමේ පුළුල් වැඩ පිළිවෙලක් අධ්‍යාපන අධිකාරීන් විසින් ආරම්භ කළයුතුව ඇත. එසේම මීට සමාන තත්ත්වයන් පැවති වෙනත් රටවල අත්දැකීම් අනුව පසු කාලයේ මෙම සංක්‍රමණික ශ්‍රමය ආපසු පැමිණීමේ දී විශාල සමාජ ආර්ථික ප්‍රශ්න ඇති කරන බව පෙන්වා ඇත. එබැවින් මොවුන් අනාගතයේදී එළදයී දේශීය රැකියාවල නියුක්ත කිරීමේ ප්‍රශ්නය කෙරේ කඩිනම් අවධානය යොමුවිය යුතුය.

## විදේශීය වෙළෙඳාම

ශ්‍රී ලංකාවේ වෙළෙඳ තුලනය (රේගු සංඛ්‍යා අනුව), 1979 දී රුපියල් දශ ලක්ෂ 7,287 (විගැහි දශ ලක්ෂ 362) ක හිඟයක් පෙන්නුම් කළේය. 1978 දී වෙළෙඳ හිඟය වූයේ රුපියල් දශ ලක්ෂ 1,480 (විගැහි දශ ලක්ෂ 100) කි. ඇතැම් රාජ්‍ය ආයතන විසින් ප්‍රමාදව වාර්තා කරන ආනයන හා අපනයන ගනුදෙනු සඳහා රේගු සංඛ්‍යා ගැලපූ කල්හිද, 1979 වෙළෙඳ හිඟය එලෙසම පැවතුනි. 1979 වර්ෂයේදී ශ්‍රී ලංකාව අත්දුටු අයහපත් වෙළෙඳාම් තත්ත්වය නිසැකයෙන්ම දැඩි සැලකිල්ලට ලක් විය යුත්තක් වුවද, ඇත්ත